මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
நிதி மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு
MINISTRY OF FINANCE AND ECONOMIC AFFAIRS

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2018.11.08

## නව මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් බදු අභියාචනා කොමිෂන් සභාව සක්‍රීය කෙරේ.

කලක් අක්‍රියව පැවැති බදු අභියාචනා කොමිෂන් සභාවට නව සාමාජිකයන් පත්කරමින් අග්‍රාමාත්‍ය හා මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් එම කොමිෂන් සභාව යළි සක්‍රීය කර ඇත. විනිශ්චයකාර හෙක්ටර් යාපා මහතා බදු අභියාචනා කොමිෂන් සභාවේ සභාපති ලෙසද, විනිශ්චයකාර සුනිල් රාජපක්ෂ මහතා සහ හිටපු විගණකාධිපතිවරයෙකු වන එස්. ස්වර්ණජෝති මහතා එහි සාමාජිකයන් ලෙස පත්කරනු ලැබ ඇත.

2011 අංක 23 දරණ බදු අභියාචනා කොමිෂන් සභා පනත යටතේ පිහිටුවා ඇති මෙම බදු අභියාචනා කොමිෂන් සභාව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ බදු ගෙවන්නෙකුට ඇතිවන්නා වූ යම් ආරවුලක් වේනම් ඉක්මනින් විසඳා ගැනීමට පහසුකම් සැලසේ.

බදු ගෙවන්නෙකුට තමන්ගේ වාර්තාව අනුව ගෙවිය යුතු යම් බද්දක්, ගාස්තුවක් හෝ අයකිරීමක් පැනවීම හා අදාළ යම් කාරණාවක් සම්බන්ධයෙන් යම් දුක්ගැනවිල්ලක් තිබේනම් ඒවා මෙම කොමිෂන් සභාවට යොමුකළ හැකිය. එම අභියාචනා විභාග කිරීමෙන් අනතුරුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ රේගු දෙපාර්තමේන්තුව විසින් දෙන ලද තීන්දු හා නියමයන් අඩු කිරීමට, සංශෝධනය කිරීමට හෝ සනාථ කිරීමට මෙම කොමිෂන් සභාවට බලය හිමිවේ.

මෙම කොමිෂන් සභාව ඉදිරියේ දැනටමත් බදු ගෙවන්නන් විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා 224 ක් නොවිසඳී තිබෙන බැවින් මෙම කොමිෂන් සභාව සක්‍රීය කිරීම සමඟ මෙම අභියාචනා සඳහා කඩිනම් විසඳුම් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. බදු ගෙවන්නන් හට තම ගැටලු වලට කඩිනමින් විසඳුම් ලබාදීම සඳහා බදු අභියාචනා කොමිෂම වැනි ආයතනයන් සක්‍රීය කිරීමෙන් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර පහසු කිරීමේ වාතාවරණයන් තවදුරටත් පුළුල් වනු ඇත.

එම්.අලි හසන්
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය